# ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය  2021

## ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ  මහලේකම් හව්ලින් සාහෝ මහතාගේ පණිවුඩය

තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය කරා  ගමන් කරන අපගේ සමාජය ඩිජිටල් ආර් ථිකය හා තොරතුරු සමාජයට නැඹුරු වූ ඩිජිටල් පරිවතර්නයකට ලක්වීම සිදු ව ඇත.

 තොරතුරු සමාජය COVID-19 ට එරෙහිව කටයුතු කරන  ප්‍රධාන ආරක්ෂක මාගර්යක් ලෙසද  කැපී පෙනේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වැදගත්කම මෙන්ම  රටවල් තුළ සහ රටවල් අතර  පවත්නා අසීමිත ඩිජිටල් අසමානතාවයන් පිළිබඳව  විශේෂ අවධානය යොමු කර ඇති බොහෝ සාථර්ක වූ අවස්ථා තිබේ.

මෙම තීරණාත්මක වසර තුළදී   ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය  විසින් ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය  යොදා ගනිමින් සියලුම ව්‍යාපාර ක්ෂේත්‍ර  මෙන්ම  මිනිසාගේ ජීවිතවල සෑම අංගයක්ම ඩිජිටල් පරිවතර්නය කරා මෙහෙයවා ලෝකය එක්සත් කිරීමට කටයුතු කරනු ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවධර්නය පිළිබඳ ජාතික උපාය මාර් ග ශක්තිමත් කිරීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා ඩිජිටල් කුසලතා සඳහා ආයෝජන දිරිගැන්වීමට සුහුරු ප්‍රතිපත්ති හා  ඵලදායී ක්‍රියාමාගර් ගැනීම මෙන්ම  ඩිජිටල් ආර් ථිකයේ කේන්ද්‍රය වන  කෘතිම බුද්ධියේ සිට පස්වන පරම්පරාව (AI - 5G) දක්වා නව තාක්‍ෂණයන් සමඟ අපගේ සේවාවන් වැඩිදියුණු කිරීමට මෙය අවස්ථාවක් වේ.

 මේ අනුස්මරණීය මොහොතේදී ඉල්ලා  සිටින්නේ  සහයෝගීතාව සහ හවුල්කාරිත්වය යි. ලෝක තොරතුරු සමාජ සමුළුවේ ක්‍රියාමාර් ග ,  ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ  2030  වසර සම්බන්ධ කරන න්‍යාය පත්‍රය, එක්සත් ජාතීන්ගේ තිරසර සංවධර්න ඉලක්ක මෙන්ම  ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ 2021 ලෝක විදුලි සංදේශ සංවධර්න සමුළුවේ "තිරසාර  සංවධර්නය සාක්ෂාත් කර ගැනීම සඳහා ගෝලීය ඩිජිටල් ආථර්ිකයට සෑම  කෙනෙකුම  සම්බන්ධ කිරීම" යන තේමාව ඉදිරියට ගෙනයාම පිණිස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ බලය උපයෝගී කර ගැනීම සඳහා අපගේ ප්‍රයත්නයන් අඛණ්ඩව කරගෙන යන ලෙස මම අපගේ සාමාජිකයින්ගෙන් සහ අනෙකුත් පාශර්වකරුවන්ගෙන් ඉල්ලා සිටිමි.  එවිට  අප දකින වේගවත් ඩිජිටල් පරිවතර්නය  යථාතර්යක් වනු ඇත.

ඔබගේ සාර් ථකත්වයන් ගැන පමණක් නොව, ඔබගේ අභියෝග සහ උගත් පාඩම් ගැනද අපට ඇසීමට අවශ්‍යය. දැන් එම අත්දැකීම් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සමග බෙදා ගන්න ;  "අභියෝගාත්මක අවධිවලදී ඩිජිටල් පරිවතර්නය වේගවත් කිරීම" යන තේමාව යටතේ 2021 මැයි 17 වන දින ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ  දිනය සැමරීමේදී අපි  ඔවුන්ට  සුදුසු අවස්ථාව ලබා දෙන්නෙමු.  එතෙක් ආරක්ෂිතව සහ සුවෙන් සිටින්න, ශක්තිමත් වන්න!

හව්ලින් සාලහෝ

මහ ලේකම්

ජාත්‍යන්තර විදුලි සංලේශ සංගමය